**සුනාමි බලපෑමට ලක් වූ ප්‍රදේශ යළි ගොඩනැගීමේ ව්‍යාපෘතියේ - "එෆ" සංරචකය (ටීඒඒආර්පී - "එෆ" සංරචකය) - 2010**

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව ,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය සහ සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

---------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 287,988,444 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 උනට සමුච්චිත වියදම රු. 1,388,599,406 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂයේ වියදම සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| | විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2010 | 2009 | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | සිවිල් වැඩ | 210,229,495 | 298,359,194 | 988,446,249 |
| (ආ) | උපකරණ | 6,148,037 | 3,897,636 | 62,838,763 |
| (ඇ) | ධීවර සහාය | 826,867 | - | 56,519,911 |
| (ඇ) | උපදේශක සේවා | - | 3,597,746 | 61,101,399 |
| (ඉ) | ව්‍යාපෘති කලමනාකරණය හා වර්ධක වියදම | 26,683,953 | 32,331,385 | 85,615,020 |
| (ඊ) | පාරිසරික කලමනාකරණය | - | - | 1,363,103 |
| (උ) | දේශීය බදු සහ ගාස්තු | 19,484,566 | 25,838,333 | 128,773,641 |
| (ඌ) | වැඩ පූර්ව අත්තිකාරම් | 24,615,526 | 8,252,782 | 3,941,320 |
| | එකතුව | 287,988,444 | 372,277,076 | 1,388,599,406 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමට ඌණ පූර්ණය කිරීම් හා එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ 2010 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පවත්නා ශේෂය පහත පරිදි වේ.

| | රු. | එ.ජ.ඩො. |
|---|---|---|
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | 48,442,075 | 423,502.47 |
| එකතුකලා | | |
| ඌන පූර්ණය කිරීම් | 1,835,150 | 16,075.03 |
| විදේශ විනිමය පාඩුව | (164,926) | - |
| | 50,112,299 | 439,577.50 |
| අඩුකළා | | |
| ආපසු ගැනීම් | 50,112,299 | 439,577.50 |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 0 | 0 |

## 3. විගණන නිරීක්ෂණ

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම් වලට අනුව කොන්ත්‍රාත්තු සිදු නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තු දෙකක් අවසන් කර තිබුණ ද, 2010 දෙසැම්බර් 31 දිනට රු. 5,671,164 ක් වූ හිඟ වැඩ පූර්ව අත්තිකාරම් 2011 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුගෙන් වැඩිපුර අය කර ගන්නා ලද රු. 2,347,198 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් 2010 වර්ෂය අවසානය දක්වා ආපසු ගෙවා නොතිබුණි.

(ඇ) රු. 2,071,319 ක් වූ ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් කිසිදු වලංගු හේතුවක් නොදක්වා රඳවා ගෙන තිබුණි.

(ඈ) උපයෝගී ලියකියවිලි නොමැති වීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් රු. 1,200,522 ක් වූ කොන්ත්‍රාත් ගෙවීම් පතිපූර්ණයන් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඉ) වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අදාල වූ වියදම රු. 47,509,587 ක් මෙම ව්‍යාපෘතියේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඊ) නොවිසඳුනු ප්‍රශ්න

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගාලු බටහිර වෙරළ තීරය පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් සැලසුම් හා නිර්මාණ, ටෙන්ඩර් ලියකියවිලි, උපදේශක සේවා ආදිය පිළියෙල කිරීම සඳහා 2008 වර්ෂය තුලදී රු. 4,266,025 ක මුදලක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි. ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනයෙහි මෙම පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, පුනරුත්ථාපන වැඩ සමාලෝචිත වර්ෂය තුලදී හෝ ආරම්භ කර නොතිබුණි.

(ii) පහත දැක්වෙන ගොඩබිම් ස්ථාන ඉදිකිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තාව, සැලසුම් හා නිර්මාණ, ප්‍රමාණ පත්‍ර ආදිය පිළියෙල කිරීම සඳහා පෞද්ගලික සමාගමකට රු. 8,551,997 ක මුදලක් ගෙවා තිබුණි.

- හරස්පොළ
- කප්පරතොට
- පැරැලිය
- ගන්දර

ව්‍යාපෘතිය සඳහා පිළියෙල කර තිබුණු අයවැයෙහි මෙම ඉදිකිරීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2011 නොවැම්බර් 30 දක්වාත් මෙම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.